# ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ ගරු සාමාජිකත්වය හා සම්ප්‍රශංසා සම්මාන ප්‍රදානය 2025

**සංස්කාරක**
පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව

**සහාය සංස්කාරක**
පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර
පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව**

ගරු සාමාජිකත්වය හා සම්ප්‍රශංසා සම්මාන ප්‍රදානය

© ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව


| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | 2025 |
| සංස්කාරක: | පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව |
| සහාය සංස්කාරක: | පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර<br>පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක |
| නිර්මාණය | පුරාවිද්‍යාඥ ආචාර්ය දම්මි බණ්ඩාර |
| මුද්‍රණය | සිත්රූ ක්‍රියේෂන්, ගම්පහ |

## Message from the President

As the President of the Sri Lanka Council of Archaeologists (SLCA), the island's sole professional body for archaeology established through a Parliamentary Act (Incorporated Act, 1992), I am truly delighted to extend this congratulatory message to the recipients of the Honorary Membership and Awards of Appreciation at the 31st Annual General Meeting of the SLCA in 2025.

This year's three awards hold special significance. For the first time in its history, after extensive deliberations, the SLCA has resolved to confer Honorary Membership upon a non-native archaeologist who has made significant contributions to the advancement of archaeology in Sri Lanka. Dr. Mats Gunnar Mogren, in collaboration with the Postgraduate Institute of Archaeology (PGIAR), played a pivotal role in establishing Settlement Archaeology and mentoring a new generation of archaeologists on the island. In recognition of his invaluable contributions, the SLCA deems this honour most appropriate.

Similarly, in another historic first, the SLCA is presenting two Awards of Appreciation (සම්ප්‍රශංසා සම්මාන) to two of its esteemed members who have retired from service after making significant contributions to archaeology in Sri Lanka. A dedicated SLCA sub-committee, following thorough deliberations, recommended two distinguished archaeologists, whose nominations were unanimously accepted by the Council.

Archaeologist Chitra Dambadeniarachchi, who served for 33 years in various capacities at the Central Cultural Fund, retired last year as the Assistant Director of Publications. A Fellow of the SLCA, Mrs. Dambadeniarachchi has also held key positions within the SLCA Council,

including Vice President, and has actively contributed to advancing the field of archaeology.

Mr. Namal Koddithuwakku, a member of the SLCA, served in multiple roles, including Assistant Director of Museums, Survey, and Excavations, before retiring in 2023 as the Deputy Director of Epigraphy and Numismatics at the Department of Archaeology. His contributions to these fields are highly commendable.

The SLCA firmly believes that all these nominees are truly deserving of these honours. On behalf of the SLCA, I extend my heartfelt congratulations to the recipients of these prestigious awards. These accolades align with the objectives of the Sri Lanka Council of Archaeologists, which is dedicated to the "advancement of the study and practice of archaeology and related disciplines, the organization and regulation of archaeological education, and the protection and promotion of the status and interests of the archaeological profession."

Wijerathne Bohingamuwa, DPhil (Oxon), MPhil (Cantab.), FCCS
President, Sri Lanka Council of Archaeologists

**ගරු සාමාජිකත්වය හා සම්ප්‍රශංසා සම්මානලාභීන්ගේ නාමලේඛනය**

1. Dr Mats Gunnar Mogren
2. පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි
3. පුරාවිද්‍යාඥ කේ.ඒ.එස්.නාමල් කොඩිතුවක්කු

# Citation for Dr Mats Gunnar Mogren

## Conferral of Honorary Membership of the Sri Lanka Council of Archaeologists



### Prelude

Dr Mats Mogren is a highly esteemed Swedish archaeologist specializing in Historical and Mediaeval Archaeology. His contributions to the field are both profound and extensive, particularly in the realm of Sri Lankan archaeology. Through rigorous research, academic collaborations, scholarly publications, training programmes, and advancements in settlement archaeology, Dr Mogren has significantly influenced the discipline. His engagement in Sri Lanka, spanning from 1988 to 1995, was primarily concentrated on the Settlement Archaeology of the Sigiriya-Dambulla Region. This project, undertaken in collaboration with the Postgraduate Institute of Archaeology (PGIAR) in Sri Lanka under the visionary leadership of the late Professor (Emeritus)

Senake Dias Bandaranayake, played a pivotal role in establishing Settlement Archaeology as a recognized sub-discipline in Sri Lanka (Mogren, 1994; Mogren, 1995).

In recognition of Dr Mogren's invaluable contributions to Sri Lankan archaeology, the Sri Lanka Council of Archaeologists (SLCA), the island's sole professional body for archaeology established through a parliamentary Act (Incorporated Act 1992), has deliberated extensively and resolved to confer upon him honorary membership. Consequently, I seek the permission of this distinguished assembly to formally present his citation. However, I must acknowledge that this is neither an exhaustive citation nor a comprehensive biography of Dr Mogren. His contributions are well known within Sri Lankan archaeological circles, particularly among senior scholars, thus requiring no extensive introduction. As such, this citation serves as formal recognition, and I extend my apologies to Dr Mogren for not providing a more detailed account of his extensive career and achievements.

**Academic and Professional Background**

Dr Mogren began his academic journey at the College (Classics), Karlstad (1971–1974), before obtaining a Bachelor of Arts in Archaeology, Ethnology, Cultural Anthropology, and Art History from Uppsala University in 1980. He further pursued an Master of Arts in Mediaeval Archaeology at Lund University in 1984 and completed his PhD. in Mediaeval Archaeology at the same institution in 2000, with a dissertation titled *Faxeholm i maktens landskap. En historisk arkeologi (Faxeholm in the Landscape of Power: A Historical Archaeology).*

Dr Mogren’s professional career began at the National Heritage Board, Sweden, where he served as a field archaeologist, project director, and publisher (1977–2011). He also held academic positions at Lund University, including Deputy Lecturer in Mediaeval Archaeology (1996–1997) and Postdoctoral Lecturer in Historical Archaeology (2005–2011). His career culminated as an Archaeological Heritage Advisor (2012–2020) at the County (Provincial) Administration, Skåne, Sweden.

## Contributions to Sri Lankan Archaeology

However, it is Dr Mogren’s contributions to Sri Lankan archaeology that concern the Sri Lanka Council of Archaeologists today. Between 1988 and 1995, he played a crucial role in the Settlement Archaeology of the Sigiriya-Dambulla Region, a collaborative research initiative with the Postgraduate Institute of Archaeology (PGIAR) under the leadership of Professor Senake Dias Bandaranayake. This project was instrumental in establishing settlement archaeology as a distinct sub-discipline in Sri Lanka. Research carried out under this project in the region provided critical insights into settlement patterns, land use, and subsistence strategies from the Mesolithic period to historical times, emphasizing the intricate interplay between environmental factors such as water management and agriculture, and the socio-political structures of ancient Sri Lankan societies.

### Training a Generation of Archaeologists

Some of the key achievements of the aforesaid Settlement Archaeology of the Sigiriya-Dambulla Region project, of which Dr Mogren was the main coordinator and consultant, are summarised in the Swedish journal Current Swedish Archaeology (Vol. 7, 1999), in an article entitled *"Seven Years in Sihagiri Bim".* In the author’s own words, the most important achievement was the training of about 100 Sri Lankan archaeologists and

students in the field methods in settlement archaeology, which was also the main objective of the project itself. 'The project was considered educational first and research-orientated second. Nothing similar had been attempted on that scale before'. This initiative played a crucial role in training, mentoring, and inspiring a new generation of Sri Lankan archaeologists, many of whom have since become leading figures in the discipline.

Notable scholars who were either involved in various capacities or trained in this project include senior professors Anura Mantunga, Raj Somadeva, Prishanta Gunawardhana, Gamini Adikari, and Malinga Amarasinghe, Professors D.K. Jayarathne, and Yamuna Herath, and Drs Senerath Dissanayake, Arjuna Thantilage, T.R. Premathilake, Priyantha Karunarathne, Rose Solangaarachchi and Mrs Chithra Dambadeniarchchi and Mandalika Manjusri. I, Dr Wijerathne Bohingamuwa, also take pride in having been a pre-university trainee of this project.

**Establishing '*Podiminissunge Puravidyawa*" (Archaeology of the common man):**

Another achievement of the project was to establish what is known as "*Podi Minissunge Puravidyawa*" (archaeology of the common man). It was also one of the project objectives, as the archaeology on the island until then had largely been 'monument orientated'. This initiative, inspired by Professor Bandaranayake, shifted the focus of Sri Lankan archaeology from monument-oriented studies to understanding rural societies and the lives of common people.

**Many 'Firsts' in Sri Lankan Archaeology:**

The Settlement Archaeology Project of the Sigiriya-Dambulla Region was a multi-faceted initiative focused on studying the lives of common people, including past procurement and production processes like irrigation and iron production. It introduced several 'firsts' in Sri Lankan archaeology: For example, prehistoric archaeology moved from the central highlands to the dry zone lowlands with Gamini Adikari and colleagues' excavation of the first Mesolithic dry zone sites in the lowlands. Similarly, first excavations of rural settlements were undertaken at Ibbankatuva-Polwatte. Then the introduction of ethnoarchaeology to settlement studies to highlight the importance of ecological aspects. The establishment of a laboratory for palaeoecology at PGIAR was one of the outcomes of this project. This led to the pioneering work of T.R. Premathilake and Arjuna Thanthilage. Eva Myrdal's irrigation work was also part of this ecological approach of the project that combined empirical data with those of the texts. The coordinated excavations and explorations of the Eastern Precinct and the Ramakale complex led by Priyantha Karunaratne and Raj Somadeva, respectively, offering a nuanced understanding of the region's historical development. However, this project was not only a training curve for the locals alone, as Dr Mogren acknowledged how his career was shaped by the insights and experience, he gained working with Sri Lankan colleagues, particularly with Prof. Bandaranayake.

**Introduction of Scandinavian Perspectives:**

Dr Mogren played a pivotal role in introducing Scandinavian archaeological perspectives and methodologies to Sri Lanka, particularly in the areas of landscape archaeology, settlement analysis, and environmental archaeology. His comparative studies between Scandinavian and South Asian settlement patterns provided a broader

context for understanding Sri Lanka's unique archaeological landscapes. This approach led to the broadening the theoretical and methodological scope of Sri Lankan archaeology beyond its traditional Anglo-European influences. This appears to have been one of the objectives of Prof. Bandaranayake when he invited the Swedish archaeologists to the island.

**Research Publications:**

The findings of this research project have been extensively published. Notably, junior colleagues involved in the project were encouraged to disseminate their own findings, with some subsequently completing their doctoral degrees based on the project's results. Two significant publications from this research include edited volumes entitled:

- Bandaranayake, S. et al., (eds) 1994. The Settlement Archaeology of the Sigiriya- Dambulla Region. Colombo: PGAIR.
- Bandaranayake, S. et al., (eds) 1995. Further Studies in the Settlement Archaeology of the Sigiriya-Dambulla Region. S. Bandaranayake et al (eds). Colombo: PGIAR.

Other publications include;

- Mogren, M. (1999). Seven Years in Sihagiri Bim: An Account of a Sri Lankan-Swedish Collaboration in Settlement Archaeology in Sigiriya 1988-1995. Current Swedish Archaeology, 7.
- Mogren, M. (1990a). Towards the Development of World Archaeologies: The Mutual Benefit from Collaboration Programmes. Ancient Ceylon, 9, 125-130.
- Mogren, M. (1990b). Swidden Cultivation: A Safety-Valve in a Feudal Society? Ancient Ceylon, 9, 131-138.

Theoretical and methodological frameworks introduced by Dr Mogren continue to influence studies on land use, socio-economic transformations, and environmental archaeology in Sri Lanka.

**Recognition and conferring Honorary Membership**

In recognition of his profound contributions to Sri Lankan archaeology—ranging from pioneering research and academic collaboration to mentorship and the introduction of innovative methodologies—the Sri Lanka Council of Archaeologists proudly confers upon Dr Mats Gunnar Mogren an honorary membership.

Prepared by Dr Wijerathne Bohingamuwa
*President, Sri Lanka Council of Archaeologists*

*28th March 2025*
*At the Auditorium of the National Museum,*
*Colombo, Sri Lanka.*

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව නියෝජනය කරමින් පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අගනා මෙහෙයක් ඉටුකොට ඉසිඹු ලූ ශාස්ත්‍රඥයන් වෙනුවෙන් කරනු ලබන සම්ප්‍රශංසා සම්මාන ප්‍රදානය යි.**

**පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි**



## හේතු පාඨය

නො. 313/7, සූරියවැව, කඩවත ලිපිනයේ පදිංචි දඹදෙණිආරච්චිගේ චිත්‍රාංගනී දඹදෙණිආරච්චි හෙවත් චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය මධ්‍යම සංස්කෘතික අරමුදලේ විවිධ තනතුරු දරමින් හිඳ අවසානයේ දී ප්‍රකාශන අංශයේ සහකාර අධ්‍යක්ෂවරිය ලෙස සේවය කර 2024. 12. 21 වන දින 33 වසරක රාජකාරි දිවිය නිමාකොට විශ්‍රාම ලබාගත්තා ය. ඇය සිය සේවා කාලය තුළ තම වගකීම රැකියාවට පමණක් සීමා නොකොට පුරාවිද්‍යා වෘත්තීය හා වෘත්තිකයන් වෙනුවෙන් පෙනී සිටියා ය. ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ අධි සාමාජිකත්වය දරණ චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය එම සභාවේ ආරම්භක සාමාජිකාවක් ද වේ.

චාර්ලිස් දඹදෙණිආරච්චි සහ අනුලා කුලතුංග දම්පතීන්ට දාව වර්ෂ 1964 දෙසැම්බර් මස 21 වන දින පවුලේ කුළුඳුල් දරුවා ලෙස ජන්මලාභය ලැබූ චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මියට සොහොයුරියන් හය දෙනෙකු සහ එක් සොහොයුරෙක් සිටී. ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ඓතිහාසික අත්තනගලු පුරවරයේ වෙලගෙදර නැමති සුන්දර ගම්පියසේ හැදී වැඩෙන චිත්‍රා දඹදෙණිආරච්චි දැරිය උඩගහවල්පොල බාලිකා විද්‍යාලයෙන් සිය මූලික අධ්‍යාපනය ලබා ද්විතීයික අධ්‍යාපනය සඳහා උඃරාපොල මධ්‍යමහා විද්‍යාලයට ඇතුළත් විය. එහි දී කලා විෂය ධාරාවෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස්පෙළ විභාගය ඉහළින් ම සමත් වන ඇය 1984 වර්ෂයේ දී විශ්වවිද්‍යාල වරම් ලබා කැලණිය සරසවියට තේරීපත්වීමට භාග්‍යවන්තියක විය. ඇයගේ ජීවිතයේ ප්‍රථම හැරවුම් ලක්ෂය සනිටුහන් වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයෙනි. ඒ අන් කවරක් නිසාවත් නොවේ. ඇයගේ සිතෙහි තිබුණු බලාපොරොත්තුව වූ පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදී ගෞරව උපාධි පාඨමාලාවට තේරී පත්වීමෙනි. මහාචාර්ය සේනක බණ්ඩාරනායක වැනි විෂය ප්‍රාමාණික දැවැන්තයින් යටතේ අධ්‍යයන කටයුතුවල නියැලුණ ඇය 1991 වර්ෂයේ දී දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත ව සිය ප්‍රථම උපාධිය සම්පූර්ණ කළා ය.

## වෘත්තීය පළපුරුද්ද

විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණ කළ වහාම එනම් 1991 වර්ෂයේ දී ම ඇය මධ්‍යම සංස්කෘතික අරමුදලේ පර්යේෂණ නිලධාරිණියක ලෙස තම වෘත්තීය ජීවිතය ආරම්භ කළා ය. එතැන් පටන් විශ්‍රාම යන තුරු පුරාවිද්‍යා වෘත්තියේ අභිවෘද්ධිය වෙනුවෙනුත් පුරාවිද්‍යා වෘත්තිකයන් වෙනුවෙනුත් විශාල මෙහෙයක් සිදුකළ පුරාවිද්‍යාඥවරියන් අතර ප්‍රමුඛස්ථානයෙහි සැළකිය හැකි ය. මහාචාර්ය සේනක බණ්ඩාරනායක, මහාචාර්ය පී.එල්. ප්‍රේමතිලක, ආචාර්ය රෝලන්ඩ් සිල්වා, මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න, මහාචාර්ය විනී විතාරණ, මහාචාර්ය අබය ආර්යසිංහ, මහාචාර්ය ඒ.ඒ.ඩී. අමරසේකර, මහාචාර්ය එච්.ටී. බස්නායක, මහාචාර්ය අනුර මනතුංග වැනි විද්වතුන්ගේ ගුරුහරුකම් හා මගපෙන්වීම යටතේ වෘත්තීය ජීවිතය ආරම්භ කළ චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය දෙස් විදෙස් පුහුණු වැඩසටහන් රැසකට ද සහභාගි වී ඇත. ශ්‍රී ලංකා ස්වීඩන්

පුරාවිද්‍යා සහයෝගීතා ව්‍යාපෘතිය ජර්මන් ශ්‍රී ලංකා පුරාවිද්‍යා ව්‍යාපෘතිය ඒ අතරින් ඇගේ වෘත්තීය ජීවිතයට විශේෂිත වේ.

ඉන් නොනැවතුණ ඇය තම වෘත්තීය තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා නිරන්තරයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත විය. ඇය 2000 වර්ෂයේ දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ස්මාරක සංරක්ෂණය හා සංස්කෘතික උරුම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ද, 2005 වර්ෂයේ දී කෞතුකාගාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ද සම්පූර්ණ කළා ය. අනතුරු ව 2010 වර්ෂයේ දී ඇය පුරාවිද්‍යා උරුම කළමනාකරණය සහ සීගිරිය ලෝක උරුමය යන මැයෙන් ස්වාධීන නිබන්ධනය ඉදිරිපත්කරමින් පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය සම්පූර්ණ කළා ය.

III ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරිණියක ලෙස රාජකාරි ආරම්භ කළ චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය විශ්‍රාම යන විට සහකාර අධ්‍යක්ෂ (ප්‍රකාශන) ලෙස කටයුතු කළා ය. එසේ ම ඇය 2010 වර්ෂයේ සිට මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති කළමනාකාරවරියක ලෙස සේවය කර ඇත. ඇය බටලීය අනුරු පාසැලෙහි සහකාර අධ්‍යක්ෂවරිය ලෙස ද, ගාල්ල, මාතර, තිස්සමහාරාය සහ රම්භා විහාර ව්‍යාපෘතිවල සහකාර අධ්‍යක්ෂවරිය ලෙස ද, බස්නාහිර පළාත් ව්‍යාපෘතියේ සහකාර අධ්‍යක්ෂවරිය ලෙස ද, පුස්කොල පොත් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරිය ලෙස ද තම දායකත්වය උපරිමයෙන් ලබා දී ඇත. එසේ ම ඇය සීගිරිය කෞතුකාගාරයේ ඇතුළත නිර්මාණ කටයුතුවලටත් කොළඹ ජාතික කෞතුකාගාරයේ මැදිරි නිර්මාණයන්ටත් සිය දායකත්වය සපයා ඇත.

එසේ ම ඇය 1996 - 1997 වර්ෂවල කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ සහකාර කථිකාචාර්යවරියක ලෙස ද සේවය කර ඇත.

## පර්යේෂණ හා ප්‍රකාශන

චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය විසින් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන් ඉදිරිපත් කර ඇති පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව විසිපහකට අධික ය. එම

පර්යේෂණ පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙහි උන්නතිය සඳහා විශාල දායකත්වයක් සපයා ඇත. ඒ අතරින් කිහිපයක් පමණක් පහතින් දක්වමි.

1. Practical and theoretical problems in study of ancient pottery in Sri Lanka, the abstract published in international conference on Social Science 2008, (ICSSL), University of Kelaniya, Sri Lanka
2. Some problems in Archaeological Excavation and Exploration in Sigiriya Outer Moat Area, (1995).
3. The Moats and Ramparts of the Sigiriya Royal Complex. Published in Landscape Archaeology Environmental Dynamics (1995).
4. Sigiriya: The function of Built Environment Published in WAC theme book – New Delhi (1994).
5. Stratigraphical Cores from the Sigiriya Water Garden Moats (1995)
6. සිතුල්පව්ව රජමහා විහාරය පිළිබඳ සඳහන් ග්‍රන්ථ නාමාවලිය (1999)
7. පුරාවිද්‍යාත්මක මැටිබඳුන් අධ්‍යයනයේ දී ඇතිවන න්‍යායික සහ ප්‍රයෝගික ගැටලු, සංස්කෘතික පුරාණය (1998)
8. පුරාවිද්‍යාත්මක කැණීම් සහ සැලසුම් භාවිතය (1998)
9. සීගිරිය නාගරික සංකීර්ණයේ නැඟෙනහිර ප්‍රදේශයේ ගවේෂණය සහ පර්යේෂණ කැණීම (1996)
10. පදවිය බුද්ධන්ගල ශිලාමෙවලම් (1991)
11. ආදිවාසී ළමා උරුමය, වැදිජන උරුමය, නෙප්චූන් ප්‍රකාශකයෝ, (සංස්කරණය පී. ගුණවර්ධන) (2009)

තව ද ඇය සහාය සංස්කාරකවරියක ලෙසත්, සංස්කාරකවරියක ලෙසත් සංස්කාරක මණ්ඩල සාමාජිකාවක් ලෙසත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයට කරන ලද සේවය අතිමහත් ය. ඇයගේ දායකත්වයෙන් එසේ සංස්කරණයට ලක් වූ ග්‍රන්ථ හතලිහකට අධික වේ. එසේ ම ඇය පුරාවිද්‍යාව සහ උරුම කළමනාකරණය සම්බන්ධ ව්‍යාපෘති ගණනාවක සම්බන්ධීකරණ නිලධාරිණියක ලෙස කටයුතු කර ඇත.

චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මිය ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ අධිසාමාජිකත්වය දරණ අතර ICOMOS සභාවේ යාව ජීව සාමාජිකත්වය ද, රාජකීය ආසියාතික සංගමයේ යාව ජීව සාමාජිකත්වය ද දරනු ලැබේ. එසේ ම ඇය වසර ගණනාව සිට ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ විධායක සභාව නියෝජනය කරමින් පුරාවිද්‍යා වෘත්තිය ඉහළ දැමීම සඳහා ඇපකැප වී වැඩ කටයුතු කරනු ලබයි.

චිත්‍රා දඹදෙණිආරච්චි මහත්මියගේ ජීවිතයේ දෙවන හැරවුම් ලක්ෂය 1996 වර්ෂයේ දී සිදුවේ. ඒ අන් කවරක් නිසාවත් නොවේ. ඇයගේ ජීවන සහකරු තෝරා ගැනීමයි. ඒ අන් කවරෙකුවත් නොවේ ඔබ අප කවුරුත් ආදරය කරන හඳුනන මහැඳුරු ගාමිණී ආධිකාරීන් වීම ය. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මධ්‍යම සංස්කෘතික අරමුදලේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ සේ ම ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ හිටපු සභාපතිවරයෙකු ද වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරි මහතා ඇයගේ ජීවන සහකරු වීම නිසා ම ඇයට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට මේ සා විශාල සේවාවක් සිදුකිරීමට ශක්තිය හා ධෛර්ය ලැබුණ බව නොරහස කි.

මේ ආකාරයෙන් ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සුවිසල් මෙහෙවරක් ඉටුකරමින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සිට විශ්‍රාම ගත් දඹදෙණි ආරච්චිගේ චිත්‍රාංගනී දඹදෙණිආරච්චි මහත්මියගේ ශාස්ත්‍රීය සේවාව අගයනු වස් අද දින මෙසේ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව මගින් ගෞරව බහුමානයට පාත්‍රකරනු ලබන වගයි.

සම්පාදනය<br>
පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක<br>
2025 මාර්තු මස 28 දින<br>
කොළඹ ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරයේ දී ය.

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව නියෝජනය කරමින් පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අගනා මෙහෙයක් ඉටුකොට ඉසිඹු ලූ ශාස්ත්‍රඥයන් වෙනුවෙන් කරනු ලබන සම්ප්‍රශංසා සම්මාන ප්‍රදානය යි.**

**පුරාවිද්‍යාඥ කේ.ඒ.එස්.නාමල් කොඩිතුවක්කු**



**හේතු පාඨය**

අංක 64/80, යසපාල හේරත් මාවත, පුල්ලෙයාර් හන්දිය, අනුරාධපුර. යන ලිපිනයේ පදිංචි පුරාවිද්‍යාඥ කොඩිතුවක්කු ආරච්චිගේ සුමිත් නාමල් මහතා 2023 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ලැබ දැනට විශ්‍රාම සුවයෙන් කල් ගෙවන පුරාවිද්‍යාඥයෙ කි.

1963 ජනවාරි මස 18 වන දින උපත ලබා ඇති ඒ මහතා සිය මූලික අධ්‍යාපනය වර්ෂ 1968 සිට 1980 දක්වා පල්ලේවල මහ විද්‍යාලයෙන් ලැබීය. අනතුරු ව කලා විෂයධාරවෙන් සිය උසස් අධ්‍යාපනය හැදෑරූ ඒ මහතා, 1984 වර්ෂයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් ව පුරාවිද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය හදාරා, 1991 වසරේ දී දෙවන පෙළ ඉහළ පංති සාමාර්තයක් ද සමඟින් සිය මූලික උපාධිය ලැබී ය. ඉනික්බිති ව කැලණිය විශ්වවිද්‍යාලයෙන් පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 1996-97 වසර තුළ දී සහ පුරාවිද්‍යාව පිළිබඳ

විද්‍යාපති උපාධිය 2002-2008 වසර තුළ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ලැබ සිය ක්ෂේත්‍රයට ඇවැසි මූලික විෂයඥානය සපුරා ගත්තේ ය.

**වෘත්තීය පළපුරුද්ද**

විශ්වවිද්‍යාලයේ මූලික උපාධියෙන් පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට බැදුණු ඒ මහතා සිය වෘත්තීය ගමන පුරාවිද්‍යා, ගවේෂණ, කැණීම්, ශිලාලේඛන, නාණක විද්‍යා ආදි ක්ෂේත්‍රයන් අළලා ප්‍රගුණ කළේ ය. අනුරාධපුර ඇතුල්නුවර, අභයගිරිය ව්‍යාපෘතිය ආදි පුරාවිද්‍යා වැඩබිම් ආශ්‍රිත ව දෙස් විදෙස් සුපතල පුරාවිද්‍යාඥයන්ගේ අධීක්ෂණය යටතේ සිය පුරාවිද්‍යා අත්දැකීම් හුවමාරු කර ගැනිමට ද මෙතුමා සමත් විය.

සිය වෘත්තීය දිවිය තුළ සිය දැනුම අන් අයට දායාද කරනු වස් 2009-2010 කාල සිමාව තුළ අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්ය වරයෙකු වශයෙන් ද, 2014-2015 කාලසීමාව තුළ රජරට විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්ය වරයෙකු වශයෙන් ද, සේවය කරන්නට විය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තු සේවා කාලය තුළ ශාස්ත්‍රීය අංශ කිහිපයක් ම නියෝජනය කරමින් එහි උන්නතිය වෙනුවෙන් සුවිසල් මෙහෙවරක් කිරීමට ද මෙතුමා සමත් විය. ඒ අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2004-2021 කාල සීමාව තුළ සහකාර අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා) තනතුර ද, 2010-2012 කාල සීමාව තුළ සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ) තනතුර ද, 2013-2014 කාල සීමාව තුළ සහකාර අධ්‍යක්ෂ (කැණීම්) තනතුර ද, 2016-2017 කාල සීමාව තුළ සහකාර අධ්‍යක්ෂ (කෞතුකාගාර) තනතුර ද, 2020-2023 කාල සීමාව තුළ සහකාර අධ්‍යක්ෂ (ගවේෂණ) තනතුර ද 2021-2023 කාල සීමාව තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා) තනතුර ද, හොඹවමින් සිය වෘත්තීය පළපුරුද්ද පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් දායාද කිරීමට සමත් විය.

එමෙන් ම ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සමාරම්භක අවධියේ පටන් සිය සාමාජිකත්වය තහවුරු කරමින්, ශිෂ්‍ය, ලියාපදිංචි, ආශ්‍රිත,

කාණ්ඩයන්හි සිට අවසන් වරට සාමාජික කාණ්ඩය හොඹවමින් පුරාවිද්‍යාඥයකු ලෙස වෘත්තීයභාවය තහවුරු කර ගත්තේ ය.

**පර්යේෂණ හා ප්‍රකාශන**

ජාතිකමය වශයෙන් සමුළු, සම්මන්ත්‍රණ කිහිපයකට සහභාගිවෙමින් සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරමින් ශාස්ත්‍රීය ලිපි ලේඛන කිහිපයක් සහ ග්‍රන්ථයක් එළි දැක්වීමට මෙතුමා සමත් විය. ඒ අතර;

1. පුරාවිද්‍යා ස්ථාන 36ක ඇති අභිලේඛන 83ක් අන්තර්ගත කරමින් අභිලේඛන සංග්‍රහය 1 යනුවෙන් 2022 වර්ෂයේ ශාස්ත්‍රීය ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම ද,
2. "ශ්‍රී ලංකාවේ බෙලියකන්ද පුරාණ සමාජය පිළිබඳ ශිලාලේඛනමය සාධක" යන මැයෙන් 2010 වසරේ සිරිනිමල් ලක්දුසිංහ අභිස්ථව ග්‍රන්ථයට ලිපියක් සැපයීම මඟින් ද,
3. "ගම්පහ දිස්ත්‍රික්කයේ කලෝටුවාව" පූර්ව ඓතිහාසික යුගයේ මැටි සුසාන සම්බන්ධ මැටි බඳුන් වාර්තාව 1997 (අමුද්‍රිත) එළිදක්වමින් ද,
4. 2006 ඔක්තෝම්බර් 25 වන දින දිනමිණ පුවත්පතේ "පුරාණ කාසිවලින් හෙළිවන අපේ ජාතික අනන්‍යතාව" ලිපිය සපයමින් ද
5. 2007 ජූලි 27 වන දින දිනමිණ පුවත්පතේ "ක්‍රිස්තු පූර්ව 2 වන සියවසේ ශ්‍රී ලංකාවේ පර්වත ලිපි" යන ලිපිය සපයමින් ද
6. 2006 ඔක්තෝම්බර් 25 වන දින දිනමිණ පුවත්පතේ අනුරාධපුර යුගයේ කාසි" ලිපිය සපයමින් ද
7. 2009 වසරේ "සීතාවක රාජධානියේ පර්වත ලිපි" යන මැයෙන් වූ සීතාවක උරුමය පිළිබඳ ගොඩගේ ප්‍රකාශනයක් ලෙස එළිදැක් වූ ප්‍රකාශනයෙන් ද
8. "ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත" අභිලේඛන පර්යේෂණ වෙළුම - 2008" එළිදක්වමින් ද

9. "ශ්‍රී ලංකාවේ තෝරාගත් ශිලාලිපි 15ක් පිළිබඳ විශ්ලේෂණය" විද්‍යාපති උපාධි නිබන්ධනය අමුද්‍රිත - 2008 ඉදිරිපත් කරමින් ද,

10. "අනුරාධපුර කැණීම්වලින් සොයා ගන්නා ලද පෞරාණික මැටි භාණ්ඩ විශ්ලේෂණය" පිළිබඳ මූලික වාර්තාව (අමුද්‍රිත) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එළි දක්වමින් ද

11. හම්බන්තොට දිස්ත්‍රික්කයේ "පුරාණ රුහුණේ සෙල්ලිපි" අමුද්‍රිත රුහුණු විශ්වවිද්‍යාලය - 2010 පලකරමින් ද

12. ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත "අභිලේඛන පර්යේෂණ සංග්‍රහය " 2010 සිට 2022 දක්වා වාර්ෂික ව එළි දක්වමින් ද

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සුවිසල් මෙහෙවරක් ඉටුකරමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිට ඉසිඹු ලූ කේ.ජ්. සුමිත් නාමල් මහතාගේ ශාස්ත්‍රීය සේවාව අගයනු වස් අද දින මෙසේ ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව මඟින් ගෞරව සම්මානයට පාත්‍ර කරනු ලැබේ.

සම්පාදක<br>
පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර<br>
2025 මාර්තු මස 28 දින<br>
කොළඹ ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරයේ දී ය.

# ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව 2024

## පාලක සභාව

**සභාපති** පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව

**ආසන්නතම පූර්ව සභාපති** පුරාවිද්‍යාඥ ආචාර්ය රෝස් සෝලංගආරච්චි

**ජ්‍යෙෂ්ඨ උප සභාපති** පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න

**උප සභාපති** පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල

**සම ලේකම්** පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්. විජේබණ්ඩාර

පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ

**භාණ්ඩාගාරික** පුරාවිද්‍යාඥ ඩබ්.බී. වැපිටිය

**උප භාණ්ඩාගාරික** පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව

**කාරක සභික** පුරාවිද්‍යාඥ පූජ්‍ය රන්නේ සීලවිමල හිමි

පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙනිආරච්චි

පුරාවිද්‍යාඥ ආචාර්ය අරුණ රාජපක්ෂ

පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක

පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා

පුරාවිද්‍යාඥ මනුර ජයසුන්දර

පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත

පුරාවිද්‍යාඥ ටී.ජී.එස්.ඒ. ගමගේ

සුරංග ගුණවර්ධන

ඔදේශිකා කුලතුංග

කේ.ඒ. ශමීරා මධුෂාණි

## අනුකමිටු

### අධ්‍යයන අනු කමිටුව

පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න මහතා(සභාපති)

පුරාවිද්‍යාඥ හරේන්ද්‍රලාල් නාමල්ගමුව මහතා (උප සභාපති)

පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා

පුරාවිද්‍යාඥ මහාචාර්ය නුවන් අබේගුණවර්ධන මහතා

ආචාර්ය අරුණ රාජපක්ෂ මහතා

පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මිය

පුරාවිද්‍යාඥ රංජිත් බණ්ඩාර මහතා

පුරාවිද්‍යාඥ කෞෂල්‍යය අබේනායක මහතා

පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මිය

## සාමාජික අනු කමිටුව

පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මිය (සභාපති)

පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මිය

පුරාවිද්‍යාඥ අනුරුද්ධ වන්නිනායක මහතා

පුරාවිද්‍යාඥ ඩබ්.බී. වැපිටිය මහතා

පුරාවිද්‍යාඥ මනුර ජයසුන්දර මහතා

## විනය අනු කමිටුව

පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මිය (සභාපති)

පුරාවිද්‍යාඥ මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා

පුරාවිද්‍යාඥ මහාචාර්ය රෝස් සෝලංගආරච්චි මිය

පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම් චන්ද්‍රරත්න මහතා

අයි.ඩී.එම්. විජේබණ්ඩාර මහතා

## තාක්ෂණික අනුකමිටුව

පුරාවිද්‍යාඥ උපුල් නිශාන්ත මහතා  (සභාපති)

පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ මහතා (සම සභාපති)

පුරාවිද්‍යාඥ පූජ්‍ය රත්නෙ සීලවිමල හිමි

පුරාවිද්‍යාඥ රංගිකා මධුමාලි මිය

ප්‍රබුද්ධිකා හෙන්දාවිතාරණ මෙය

**ප්‍රසම්පාදන කමිටුව**

පුරාවිද්‍යාඥ පී.බී. මණ්ඩාවල මහතා (සභාපති)

පුරාවිද්‍යාඥ මනුර ජයසුන්දර මහතා (සම සභාපති)

පුරාවිද්‍යාඥ චිත්‍රා දඹදෙණිආරච්චි මිය

ඔදේශිකා කුලතුංග මෙය

**පුරාවිද්‍යා අධ්‍යයන මණ්ඩලය** (BARE)

පුරාවිද්‍යාඥ ආචාර්ය විජේරත්න බෝහිංගමුව මහතා (සභාපති)

පුරාවිද්‍යාඥ මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න මහතා (සම සභාපති)

පුරාවිද්‍යාඥ මහාචාර්ය රෝස් සෝලංගාආරච්චි මිය

පුරාවිද්‍යාඥ සුජාතා පෙරේරා මිය

පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ මහතා

**තාක්ෂණික ඇගයීම් අනුකමිටුව**

පුරාවිද්‍යාඥ ආචාර්ය අර්ජුන තන්තිලගේ මහතා (සභාපති)